# අයිතිවාසිකම් ආරක්ෂා කිරීම; බෞද්ධ සූත්‍රාගත ඉගැන්වීම් හා ජාත්‍යන්තර ප්‍රඥප්තීන් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

කරදගොල්ලේ සෝභිත හිමි[1], කරපික්කඩ සෝභිත හිමි[2]

## හැඳින්වීම

මානවයා ශිෂ්ට සම්පන්න මිනිසෙකු වූයේ කවදාදැයි නිශ්චිත නිගමනයකට පැමිණීමට කිසිවකු සමත්ව නැත. නමුත් අශිෂ්ටව ජීවත් වූ මානවයා ක්‍රමයෙන් මනස පරිනාමයට පත්වී, බුද්ධිය වර්ධනය වීමෙන් ශිෂ්ට මිනිසෙකු වී තම සංස්කෘතියක් ගොඩනගා ගන්නට සමත් විය. ගෝත්‍ර යුගයේ සිට රාජ්‍ය යුගයට මානව සංක්‍රමණයේදී සංස්කෘතිකමය වශයෙන් මිනිසා ඉදිරියට ගමන් කළ අතර ආගමික, දේශපාලනික හා සාමාජික වශයෙන් ද දියුණු තත්වයකට පත්විය. එම ගමනේ දී මිනිස්සු, තමන්ගේ බලය වැඩිදියුණු කරගැනීමට මිනිසුන්ට පමණක් නොව ගහකොළට, පරිසරයට, සත්‍යාසිව්පාවාට හිමිවියයුතු අයිතිවාසිකම් විවිධාකාරයෙන් උල්ලංගනය කළහ. එනිසා විවිධ ආගම්, ආගමික නායකයෝ, දාර්ශනිකයෝ මිනිසුන් විසින් සුරක්ෂිත කර දිය යුතු අයිතිවාසිකම් හා ඒවා සුරැකීමේ වැදගත්කම පිළිබඳ කරුණු දැක්වූහ.

සමස්ත මනුෂ්‍ය ප්‍රජාව විසින් තමන්ගේ සහ ලෝකයේ යහපැවැත්ම උදෙසා මැනවින් ආරක්ෂා කොට තහවුරු කළ යුතු අයිතිවාසිකම් පිළිබඳ උගන්වන ආගම් අතර බුදුදහමට සුවිශේෂී තැනක් හිමි වෙයි. විශේෂයෙන් බෞද්ධ සූත්‍රාගත කරුණු අනුව ලෝකයේ ජීවත් වන මිනිසුන් විසින් වගවීමෙන් ඉටුකළ යුතු යුතුකම් හා සිදුනොකළ යුතු දෑ පිළිබඳ කරුණු ගෙනහැර දක්වයි. මිනිසුන් එම යුතුකම් මැනවින් ඉටුකිරීම හා වැරදි ක්‍රියාවන්ගෙන් වෙන්වීම ම සියලුදෙනාගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමක් මෙන්ම තහවුරු කිරීමක් බවට පත්වෙයි. එය මිනිසුන්ට පමණක් නොව ගහකොළට, පරිසරයට, සත්‍යාසිව්පාවාට කිසිවෙකුගේ බලපෑමක් නොමැතිව මෙම ලෝකයේ පැවැත්ම සඳහා ඇති අයිතිය සුරක්ෂිත කිරීමකි. ඒ අනුව,

- මානව අයිතිවාසිකම්
- සමාජීය අයිතිවාසිකම්
- ආර්ථික අයිතිවාසිකම්
- කාන්තා අයිතිවාසිකම්

[1] Sub Warden (Full Time), Bhiksu University of Sri Lanka, Anuradhapura, sksobhitha@gmail.com

[2] Sub Warden (Full Time), Bhiksu University of Sri Lanka, Anuradhapura, karapikkadasobitha@gmail.com

- පාරිභෝගික අයිතිවාසිකම්
- ළමා අයිතිවාසිකම්
- පාරිසරික අයිතිවාසිකම්

ආදි විවිධ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා තහවුරු කිරීම වගවීමෙන් යුතුකම් ඉටුකිරීම හා වැරදි හැසිරීමෙන් ඈත්වීම මගින් සිදුවන බවත් එයින් මිනිසාගේ මෙන්ම ස්වභාව ධර්මයේ පැවැත්ම ආරක්ෂා වන ආකාරයත් විශද කරයි.

විශේෂයෙන් දෙවන ලෝක යුද්ධයෙන් පසු විනාශ වී ගිය මානව, ස්වාභාවික හා භෞතික සම්පත් පිළිබඳ සලකා යළිත් එබඳු විනාශයක් ඇති නොවීමට වග බලාගැනීම සඳහා 1945 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය ආරම්භ විය. එමගින් 1948.12.19 දින මානව හිමිකම් සුරැකීම පිළිබඳ විශ්ව ප්‍රකාශයක් සම්මත කරගත් අතර එයිනික්බිති ජාත්‍යන්තර වශයෙන් ඇති වූ තත්වයන්ට අනුව විවිධ වර්ෂයන්හි විවිධ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතීන් ඇති කරගන්නා ලදි. ඒ අනුව

- ආර්ථික අයිතිවාසිකම්
- සමාජීය අයිතිවාසිකම්
- සංස්කෘතික අයිතිවාසිකම්
- සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම්
- ළමා අයිතිවාසිකම්
- කාන්තා අයිතිවාසිකම්
- පාරිසරික අයිතිවාසිකම්

ආදි විවිධ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතීන් ඇති කරගෙන ලෝක ජනයාගේ පැවැත්ම ආරක්ෂා කරගැනීම සඳහා රටවල් වශයෙන් පොදු එකඟතාවන් ඇති කර ගන්නා ලදි.

විශේෂයෙන් යුතුකම් ඉටුකිරීම පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් මගින් ආරක්ෂා වන මානව අයිතිවාසිකම් පිළිබඳ හා ජාත්‍යන්තර ප්‍රඥප්තීන් විමසා බැලීමේ දී බුදුදහමේ උගන්වන පංචශීල ප්‍රතිපදාව, අත්තූපනායික ධර්මපර්යාය, කාලාම සූත්‍රය ආදිය මගින් සියලුදෙනාට ජීවත් වීමේ, පෞද්ගලිකව ආරක්ෂා වීමේ හා ස්වාධීනව සිතීමේ අයිතිය, සුරක්ෂිත කොට ඇති අතර ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රඥප්තිය මගින් ද එය තහවුරු කර ඇත. එමෙන්ම බුදුදහම මගින් කාන්තාවගේ නිදහස ඇගයීමට හා ආරක්ෂා කිරීමට කටයුතු කර ඇති අතර පසුකාලීනව බිහි වූ ජාත්‍යන්තර ප්‍රඥප්තීන් මගින් ද කාන්තාවගේ නිදහස හා ආරක්ෂාව පිළිබඳ අවධානය යොමු කොට ඇත. එමෙන්ම බුදුදහමේ උගන්වන යුතුකම් ඉටුකිරීම මගින් පුද්ගලයාගේ ආර්ථික නිදහස, යහපත් රැකියාවක් කිරීමේ අයිතිය, සේවක



CamScanner

අයිතීන්, සේවා අයිතීන් ආදිය තහවුරු කර ඇත. ජාත්‍යන්තර ප්‍රඥප්තීන් මගින් ද එම අයිතීන් සුරක්ෂිත කිරීමට කටයුතු කර තිබේ. විශේෂයෙන් බුදු දහම ගහකොළ සතාසිව්පාවා හා පරිසරයේ සුරක්ෂිතභාවය පිළිබඳ කරුණු ඉදිරිපත් කර ඇති අතර ජාත්‍යන්තර ප්‍රඥප්තීන් ද ඒ පිළිබඳ අවධානය යොමු කොට ඇත.

ඒ අනුව මෙම පර්යේෂණයෙන් උත්සුක වනුයේ බුදුදහමින් විස්තර කරන යුතුකම් වගවීමෙන් ඉටුකිරීමෙන් හා වැරදි ක්‍රියාවන්ගෙන් ඉවත්වීම තුළින් ආරක්ෂා වන විවිධ අයිතිවාසිකම් පිළිබඳ ඉගැන්වීම් හා ජාත්‍යන්තර ප්‍රඥප්තීන් අතර ඇති සම විෂමතාවන් අධ්‍යයනය කිරීමත් මානව හිමිකම් ආරක්ෂා කිරීමට බුදුදහමේ ඉගැන්වීම් හා ජාත්‍යන්තර ප්‍රඥප්තීන් වඩා ප්‍රශස්ත වශයෙන් උපයෝගී කරගත හැක්කේ කෙසේ ද යන්න පිළිබඳවත් විමසා බැලීමටයි.

### පර්යේෂණ ක්‍රමවේදය

බෞද්ධ ත්‍රිපිටකාගත සූත්‍ර ධර්මත් ඒ සඳහා ලියැවී ඇති අටුවා, පරිවර්තන හා වෙනත් විස්තරකථනයන් සමන්වා බලා එමගින් විස්තර කොට ඇති අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධ කරුණු නිර්ණය කිරීම සිදුකොට ඇත. බෞද්ධ සූත්‍රාගත මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ ඉගැන්වීම් හා මානව අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තීන් තුලනාත්මකව අධ්‍යයනය කරමින් සාධනීය නිෂේධනීය තොරතුරු විමර්ශනය කර ඇත. මෙහි දී උක්ත බෞද්ධ ත්‍රිපිටකාගත සූත්‍ර ධර්මත් ඒ පිළිබඳ ලියැවී ඇති කෘති හා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තීන් සබැඳිව සිංහල, ඉංග්‍රීසි, ආදී භාෂාවන්ගෙන් ලිය වී ඇති ද්විතීයික මූලාශ්‍ර රාශියක් පරිශීලනය කොට තිබේ.

### ප්‍රතිඵල

මෙම පර්යේෂණයේ දී බුදුදහම මගින් උගන්වනු ලබන ලෝකයේ හා සත්වයාගේ පැවැත්ම උදෙසා මිනිසුන් විසින් යුතුකම් ඉටුකිරීම මගින් හා වැරදි ක්‍රියාවන්ගෙන් ඉවත්වීම තුළින් ආරක්ෂා කර දියයුතු අයිතිවාසිකම් රාශියක් හඳුනාගත හැකි විය. ඒ අනුව යුතුකම් ඉටුකිරීම හා වැරදි ක්‍රියාවන්ගෙන් ඈත්වීම මගින් ආරක්ෂා වන විවිධ අයිතිවාසිකම් හා ඒවා ආරක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳ ඉගැන් වූ දහමක් වශයෙන් බුදුදහම හඳුන්වාදිය හැකි වෙයි.
එලෙසම ලෝකයේ ඇති වූ විවිධ යුදමය තත්ත්වයන් හා පාරිසරික තත්ත්වයන් හේතුකොට ගෙන නූතන ලෝකයේ බලවත් රාජ්‍යයන් හා අනෙකුත් රාජ්‍යයන් එක්ව සියලුදෙනාගේ සුරක්ෂිතභාවය උදෙසා විවිධ සම්මුතීන් ඇති කරගත් ආකාරය ද හඳුනාගත හැකිවිය.

විශේෂයෙන් බුදුදහමෙන් ආරක්ෂා කරදීමට උගන්වා ඇති අයිතිවාසිකම් සහ ජාත්‍යන්තර ප්‍රඥප්තීන්හි අන්තර්ගත අයිතිවාසිකම් අතර සමානකම් රාශියක් දැකගත හැකිවිය. එහිලා රජය හෙවත් පාලන තන්ත්‍රය විසින් ජනතාවගේ



CamScanner

සුභසාධනය වෙනුවෙන් ගතයුතු ක්‍රියා මාර්ග පිළිබඳ චක්කවත්තිසීහනාද, කූටදන්ත ආදි බෞද්ධ සූත්‍රයන්හි තහවුරු කරනු ලබන කරුණුවලට සමාන සම්මුතීන් බොහෝමයක් ජාත්‍යන්තර ප්‍රඥප්තීන්හිද ඇතුළත්ව ඇත.

විශේෂයෙන් බුදුදහමේ උගන්වන යුතුකම් ඉටුකිරීම හා වැරදි ක්‍රියාවන්ගෙන් ඈත්වීම මගින් අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම පුද්ගලයාට ආත්මීය වශයෙන් බැඳී ඇති පරම වගකීමක් වන අතර ඒවා ආරක්ෂා නොකිරීමෙන් සිදුවන අහිතු ඵල විපාක එම පුද්ගලයාටම මෙලොව වශයෙන් සහ පරලොව වශයෙන් විඳීමට සිදුවන බව පැහැදිලි වෙයි. ජාත්‍යන්තර ප්‍රඥප්තීන් කඩ කිරීම රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් විවිධ සම්බාධකවලට ලක්වීමට හේතුවන ආකාරය හඳුනාගත හැකිය.

## නිගමනය

බුදුදහම දාර්ශනික පදනමක් මත පිහිටා මිනිසාගේ ලෞකික හා ලෝකෝත්තර යහපැවැත්ම උදෙසා ඉගැන්වීම් සිදුකර ඇත. ඒ අනුව බුදුදහමේ උගන්වන යුතුකම් ඉටුකිරීම හා වැරදි ක්‍රියාවන්ගෙන් වෙන්වීම මගින් අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම එක් එක් පුද්ගලයා විසින් තනි තනිව හා සාමූහික වශයෙන් සිදුකොට මිනිසාගේ ලෞකික මෙන්ම ආධ්‍යාත්මික සංවර්ධනයත් එයින් ලෝකොත්තර සුවය සඳහාත් උපකාර කරගත හැකි බව උගන්වයි. එය කිසිවෙකුගේ බලපෑමක් මත නොව ස්වයං ප්‍රඥාවෙන් අවබෝධ කරගෙන සම්පූර්ණ කළ යුතු පිළිවෙතකි. නමුත් ජාත්‍යන්තර ප්‍රඥප්තීන් වූ කලී රාජ්‍යයන් විසින් අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙත් වන අතර එවා ආරක්ෂා කිරීම හා කඩ කිරීමේ හැකියාව ඒ ඒ රාජ්‍යයන්ගේ බලවත්කම මත රඳාපවතී. යම් රාජ්‍යයකට අනෙකුත් රාජ්‍යයන්ගේ සහාය නොමැතිව ස්වාධීනව කටයුතු කළ හැකි නම් ප්‍රඥප්තීන් නොසලකා කටයුතු කළ හැකි අයුරු දක්නට හැකි වෙයි. නමුත් බුදුදහමේ ඉගැන්වීම පුද්ගලාවබද්ධය. එවා කඩකිරීමේ ප්‍රතිඵල විඳින්නට සිදුවන්නේ තමන්ටම වන බව දැඩි ලෙස අවධාරණය කරයි.

ප්‍රමුඛ පද: මානව අයිතිවාසිකම්, බෞද්ධ සූත්‍ර, ජාත්‍යන්තර ප්‍රඥප්ති, යුතුකම්

## ආශ්‍රිත ග්‍රන්ථ

Caṭṭsamgāyanā CDrom

K.N. Jayatilleke. (1967). *The principle of International Law in Buddhist Doctrine.* Leiden v.0l.

P.R. Ghandhi. (1995). *International Human Rights Documents.* Universal Law publishing Co.Pvt.Ltd.

*Human Rights and Religion in Sri Lanka.* (1988). Colombo:Sri Lanka Foundation.



CamScanner